**කොළඹ විශ්වවිද්‍යාලය - දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - රාජගිරිය**
**05 වන බී. ඒ. එම්. එස්. වාර්ෂික පරීක්ෂණය – 2016 ජනවාරි**
**දේශීය චිකිත්සා**

කාලය - පැය 03
සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. පෙ. ව. 9.00 – මධ්‍යාහ්න 12. 00
පිළිතුරු ලිවීමේදී සෑම කොටසක් සඳහාම වෙන වෙනම පිළිතුරු ලිවීමේ පොතක් භාවිත කරන්න.

## I කොටස (පොදු කොටස)

01 i (අ) මල මූ දෙක වැලකිම ද ..................... කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 05)
(ආ) වාත වේදනා සඳහා යෙදිය හැකි අරිෂ්ට, ගුලි, කල්ක සහ චූර්ණ දෙක බැගින් දක්වන්න. (ලකුණු 05)
ii (අ) මාදන්දම් රෝගියෙකු සඳහා යෙදිය හැකි කෂාය දෙකක් ලියා වට්ටෝරු කර යොදන ආකාරය නිවැරදිව සඳහන් කරන්න. (ලකුණු 05)
(ආ) මාන්දම් රෝගියෙකුගේ අග්නිය වැඩි කිරීම සඳහා යෙදිය හැකි ආහාර වර්ග ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

02 කෙටි සටහන් ලියන්න.
i හිරලය පහත් වීම සඳහා යෙදිය හැකි බාහිර චිකිත්සා
ii තිල වෙදකමෙහි මූල ධර්ම
iii දේශීය වෙදකමෙහි කෙම් ක්‍රම භාවිතය
iv පීනස් රෝගය සඳහා යෙදිය හැකි දුම් බෙහෙත් (ලකුණු 5 X 4 = 20)

## II කොටස (සර්පවිෂ)

03 i පොලොං දෂ්ටයකදී පහළ වන විෂ ලක්ෂණ සඳහන් කරන්න. (ලකුණු 05)
ii පොලොං විෂට ප්‍රතිකාර පද්ධතියක් ලියන්න. (ලකුණු 06)
iii දූත ලක්ෂණ මගින් දෂ්ට කල සර්පයා හඳුනාගන්නා ක්‍රම දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)
iv පහත සඳහන් අර්ථය සඟවා ඇති ඖෂධ මොනවාද ?
(අ) විජේකෝන් (ආ) තිලෝගුරු
(ඇ) රැට පැලට එන කොල (ඈ) සලඹ කුමාරයා
(ඉ) මහ පනික්කිල (ලකුණු 05)

අනික් පිටුව බලන්න.

## III කොටස (දැවුම් පිළිස්සුම්)

04 ශරීරයේ අඩක් පමණ (50%) පිළිස්සීමට ලක්වූ රෝගියකු මාසයක පමණ කාලයක් වෙනත් වෛද
ප්‍රතිකාර ලබා ගැනීමෙන් පසු ඔබ ලගට ප්‍රතිකාරය සඳහා පැමිණ ඇත.

i එම රෝගියාට පහළ වී ඇති සංකූලතා මොනවාද යන්න දක්වන්න. (ලකුණු 05

ii ඒ අනුව සිදුකරන ප්‍රතිකාර පද්ධතිය පැහැදිලිව ලියා දක්වන්න. (ලකුණු 15

## IV කොටස (අක්ෂි රෝග)

05 i ඉළක්රෝම රෝගය ඇසේ කුමන ස්ථානයක ඇතිවේදැයි දක්වා එම රෝගයේ
රෝග ලක්ෂණ දක්වන්න. (ලකුණු 06

ii මෙම රෝගය සඳහා යෙදිය හැකි ප්‍රතිකාර පද්ධතියක් දක්වන්න. (ලකුණු 14

2016. 03. 08